රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ :11/2000

මගේ අංකයඃආ/1/4/4(1)
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07
2000 ජුලි මස 14 දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රජයේ සේවකයන් සඳහා අතුරු දීමනාවක් ගෙවීම

රු.12,000/= ක් හෝ ඊට අඩු මාසික වැටුපක් ලබන රජයේ සේවකයන්ට මසකට රු.600/= ක අතුරු දීමනාවක් 2000.08.01 දින සිට ගෙවීමට රජය තීරණය කර ඇත.

02. රු.12,001/= සිට රු.12,599/= දක්වා වැටුපක් ලබන නිලධාරීන්ට මෙම දීමනාව සමඟ දළ වැටුප රු.12,600/= ක් වන සේ හීනවන ෙ ශ්ප පදනමින් මෙම අතුරු දීමනාව ගැලපිය යුතුයි.

03. 2000.08.01 දිනට පසු වැටුප් වර්ධක ලැබීම මත වැටුප රු.12,001/= සිට රු.12,599/= දක්වා වූ විට ඉහත 2 වැනි ෙ.දයේ සඳහන් පරිදි කටයුතු කළයුතුය.

04. දෛනික වැටුප් ලබන්නන්ට මෙම දීමනාව ගෙවීමේදී ගණනය කළ යුත්තේ වැඩ කරන සම්පූර්ණ දිනකට රු. 28.57 බැගින් ලීත් මසකට දින 21 ක උපරිමයකට යටත්ව වේ.

05. මෙම අතුරු දීමනාව විශ්‍රාම වැටුප් රහිතය.

06. මහා භාණ්ඩාගාරයේ එකගත්වය ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

(අත්සන)

මහින්ද බන්දුසේන
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු ලේකම්